ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

**පුවත්පත් නිවේදනය**

**ළමා නිවාසවල දරුවන් සඳහා ප්‍රවාසිකයන් විසින් සංවිධානය කරන ලද චිත්‍ර තරඟය සමීප ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා සංකේතවත් කරමින් සාර්ථකව අවසන් වේ**

ඉන්දියාවේ 75 වසරක නිදහස ශ්‍රී ලංකාව තුළ සමරමින් දිවයින පුරා ළමා නිවාසවල ශ්‍රී ලාංකීය දරු දැරියන් 2021 අප්‍රේල් 10-11 දෙදින කොළඹ ප්‍රවාසිකයන්ගේ සංගමය (මෙය ප්‍රවාසිකයන්ගෙන් සමන්විත ස්වේච්ඡා සංවිධානයක් වන අතර ඒ අතරින් වැඩි දෙනෙකු ඉන්දියානුවන් වේ) විසින් ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහ ශ්‍රී ලංකා රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ තවත් සහකරුවන් රැසකගේ සහයෝගයෙන් සංවිධානය කරන ලද සමස්ත ලංකා චිත්‍ර තරඟයේ අවසාන වටය සඳහා කොළඹට රැස් විය.

2. අධ්‍යාපන අමාත්‍ය ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ද ඉන්දීය මහ කොමසාරිස් ගරු ගෝපාල් බාග්ලේ මැතිතුමා ගෞරවනීය අමුත්තා ලෙස ද මෙම අවස්ථාවට සහභාගී විය. රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත ඇතුළු තවත් සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී විය. මෙම තරඟය පිළිබඳ ප්‍රශංසනාත්මකව අදහස් දක්වමින් සම්භාවනීය අමුත්තන් සඳහන් කළේ එය ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර ශක්තිමත් සබඳතා සඳහා අගනා නිදසුනක් වන බවයි. දරුවන් සඳහා මෙවන් වටිනා අත්දැකීම් ලබා දීමේ වැදගත්කම ද ඔව්හු අවධාරණය කළහ.

3. මෙම තරඟය උප-කණිෂ්ඨ, කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ වශයෙන් කාණ්ඩ තුනක් යටතේ පැවැත්විණ. පළමු වටය සඳහා දිවයිනේ සියලු ප්‍රදේශවල ළමා නිවාස වලින් සිසුන් 4375ක් සහභාගී විය. හොඳම චිත්‍ර 60 ඉදිරිපත් කළ දිවයිනේ සියලු පළාත්වල තරඟකරුවන්ට එක් භාරකරුවකු සමඟ අප්‍රේල් 10 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ පැවති අවසාන වටෙටආරාධනාකරනලදී. එක්එක්කාණ්ඩයේප්‍රථමස්ථානතුනදිනාගන්නාලදජයග්‍රාහකයන්ටපිළිවෙළින් ශ්‍රී ලංකා රුපියල් 100,000ක්, 50,000ක් සහ 25,000ක් පිරිනමන ලදී. තවත් ත්‍යාග රැසක් ද, සහතික පත් ද, පදක්කම් ද ජයග්‍රාහකයන්ට හිමි විය. අවසාන වටයට සහභාගී වූ සියලු තරඟකරුවන්ට විවිධ අනුග්‍රාහකයන් විසින් ලබා දුන් මුදල් ත්‍යාග, පරිඝනක සහ විවිධ ත්‍යාග පිරිනමන ලදී.

4. මෙම තරඟය ශ්‍රී ලංකාවේ 75 වන ඉන්දීය නිදහස් දින සැමරුමේ කොටසක් ද වේ. විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් රැසක් ඇතුළත් වන මෙම සැමරුම් මාලාව ඉන්දියාව නිදහස ලබා 75 වසරක් සපිරෙන 2022 අගෝස්තු මාසය වන තෙක් දිවෙනු ඇත. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා මෙම සැමරුම් 2021 මාර්තු 12 වන දින එනම් 75වන ඉන්දීය නිදහස් දින සංවත්සරයට සති 75කට පෙර ඉන්දියාවේදී සමාරම්භ කරන ලදී. 2021 අප්‍රේල් 9 වන දින නාගානන්ද බෞද්ධ අධ්‍යයන ආයතනයේ ඉන්දියානු මධ්‍යස්ථානයක් විවෘත කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ මෙම සැමරුම් මාලාව නිල වශයෙන් ආරම්භ කෙරිණ.

***

කොළඹ
2021 අප්‍රේල් 11